# ජාතික රාජ්‍ය සභාවේ 1974 අංක 27 දරන සුරාබදු (සංශෝධන) පනත

[සහතිකය සටහන් කළේ 1974 අගෝස්තු මස 19 වන දින]

ආණ්ඩුවේ නියමය පරිදි මුද්‍රණය කරන ලදී

(1974 අගෝස්තු මස 30 වැනි දින ශ්‍රී ලංකා ජනරජයේ ගැසට් පත්‍රයේ II වැනි කොටසේ අතිරේකයක් වශයෙන් පළ කරන ලදී)

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී

කොළඹ රජයේ ප්‍රකාශන කාර්යාංශයෙන් මිල දී ලබාගත හැක

ජාතික රාජ්‍ය සභාවේ 1974 අංක 27 දරන සුරාබදු (සංශෝධන) පනත

[සහතිකය සටහන් කළේ 1974 අගෝස්තු මස 19 වන දින]

එල්. ඩී.—ඕ. 66/73

## සුරාබදු ආඥාපනත සංශෝධනය කිරීම සඳහා වූ පනතකි

ශ්‍රී ලංකා ජනරජයේ ජාතික රාජ්‍ය සභාව විසින් මෙසේ පනවනු ලැබේ :—

**1.** මේ පනත ජාතික රාජ්‍ය සභාවේ 1974 අංක 27 දරන සුරාබදු (සංශෝධන) පනත යනුවෙන් හඳුන්වනු ලැබේ. *(ලුහුඬු නාමය)*

**2.** සුරාබදු ආඥාපනතේ 38 වන වගන්තිය මෙයින් ඉවත් කොට ඒ වෙනුවට පහත සඳහන් අලුත් වගන්තිය ආදේශ කරනු ලැබේ :— *(52 වන අධිකාරයේ 38 වන වගන්තිය ප්‍රතියෝජනය කිරීම.)*

*(' බලපත්‍රයක් නොමැතිව මදිනු ලබන ගස්වල මල් කපා දැමීමට ඇති බලය.)*

38. (1) බලයලත් නිලධරයකුට යම් විටක යම් ගසක මලක් යට එල්ලා තිබෙන යම් හැලියක හෝ වෙනත් භාජනයක පැසුණු රා දක්නට ලැබෙන අවස්ථාවක, ඒ ගසින් පැසුණු රා නිෂ්පාදනය කිරීමට බලය දෙන බලපත්‍රයක් වලංගුව නොමැති බවට ඔහු සෑහීමට පත් වුවහොත් එම මල කපා දැමීම හෝ ඔහු ඉදිරිපිට සහ මහුගේ අධීක්ෂණය යටතේ එම මල කපා දැමීමට සැලැස්වීම ඔහු විසින් කළ හැකි ය :

එසේ වුව ද ඒ වේලාවේ එම ගස උඩ මදින්නකු සිටිනු දුටුවහොත් එම මල කපා නොදැමිය යුතු අතර එම මදින්නා ද එම ගස අයිතිකරු ද සම්බන්ධයෙන් 35 වන සහ 46 වන වගන්ති යටතේ ක්‍රියා කරනු ලැබිය යුතු ය.

(2) (1) වන උපවගන්තියේ විධිවිධානවලට අනුකූලව ගසක මලක් කපා දමනු ලැබූ අවස්ථාවක, එම බලයලත් නිලධරයා විසින් දිස්ත්‍රික්කයේ දිසාපතිවරයා වෙත සහ සුරාබදු අධිකාරිවරයා වෙත එම ගසෙහි පිහිටීම පිළිබඳ විස්තර සහ සැපයිය යුතු යැයි එම දිසාපතිවරයා හෝ සුරාබදු කොමසාරිස්වරයා විසින් නියම කරනු ලැබිය හැකි වෙනත් යම් විස්තර දක්වෙන වාර්තාවක් ඉදිරිපත් කළ යුතුය.

(3) මේ වගන්තියෙහි—

" බලයලත් නිලධරයා " යන්නෙන්—

(අ) සුරාබදු පරීක්ෂකයකු හෝ සුරාබදු පරීක්ෂකයකුට වඩා තනතුරෙන් ඉහළ සුරාබදු දෙපාර්තමේන්තුවේ වෙනත් යම් නිලධරයෙක් ; හෝ

(ආ) දිස්ත්‍රික්කයේ දිසාපති විසින් බලය දෙනු ලැබූ යම් රාජ්‍ය නිලධරයෙක්

අදහස් වේ. '.

ඒ 08006—11,850 (74/07)